## මනෝ විද්‍යාව

# න්‍යෂ්ටිකවාදය මානසික රෝගයක් ද?

න්‍යෂ්ටිකවාදය ලෝකයේ ක්‍රියාත්මක වීමට මිනිසුන්ගේ මානසික වාතාවරණය අත්‍යවශ්‍ය පිටුබලයක් සපයන බව ප්‍රකාශ කළ හැකි ය. ඒ අනුව සමස්ථ න්‍යෂ්ටිකවාදී සංස්කෘතිය තුළ ක්‍රියාත්මක වන්නා වූ භූමිකාවන් කිසියම් මානසික අසමතුලිතතාවකින් නොහොත් මානසික රෝගී තත්ත්වයකින් පෙළෙන්නේය යනුවෙන් ප්‍රකාශ කළහොත් එය සාවද්‍යයක් නොවේ. මෑත කාලීනව ඉන්දියාව හා පාකිස්ථානය ප්‍රමුඛ දකුණු ආසියාතික කලාපයේ න්‍යෂ්ටිකවාදය ව්‍යාප්තවීමත් සමඟ ගොඩනැඟී ඇති නව ලෝක තත්ත්වය හමුවේ න්‍යෂ්ටිකවාදය නම් වූ ප්‍රපංචය මෙතෙක් එතරම් විමසුමට බඳුන්නොවූ උක්ත සන්දර්භය යටතේ විශ්ලේෂනය කිරීමට ඉන්දීය සමාජ මනෝ විද්‍යාඥයෙක් වන Ashis Nandy උත්සහ කරයි. ඒ පිළිබඳ සරල විග්‍රහයකි මේ.

න්‍යෂ්ටිකවාදය යනු න්‍යෂ්ටික ආයුධ මුල් කරගත් ආරක්ෂාව හඳුන්වනු ලබන මතවාදයයි. එය මේ යුගයේ වඩාත් ම නිර්ලජ්ජිත වූ ද, වඩාත් ම දූෂිත වූ ද, වඩාත් ම අධික වියදමක් දරන්නාවූ ද, බෙහෙවින් ම අශිෂ්ට වූ හැසිරීම් රටාවයි. එවන් මනවාදයක් ජාත්‍යන්තර සම්බන්ධතා හා දේශපාලනය, දේශපාලන සමාජ විද්‍යාව හෝ ආචාර ධර්ම විද්‍යාව වැනි විෂය ක්ෂේත්‍රයන්ගේ නියමයන් තුළින් පමණක් විනිශ්චය කළ නොහැකි ය. එය හොඳින් දන්නා, මනාව අවබෝධ කළ හැකි මනෝ ව්‍යාධිවේදික සහ ලක්ෂණයකි. (Psychopathological Syndrome) මෙහි දී Ashis Nandy ස්වකීය විග්‍රහය තුළින් උත්සහ කරනු ලබන්නේ එම මනෝ ව්‍යාධිවේදික සහ ලක්ෂණය තුළ ඇති ව්‍යාධිමය ස්වරූපය, වසංගතරෝග විද්‍යාත්මක ස්වරූපය හා රෝග විනිශ්වය පිළිබඳ කෙටි හැඳින්වීමක් කරන්නටයි.

න්‍යෂ්ටිකවාදය සමාජ හා දේශපාලන සංස්ථා තුළ හැදී වැඩී සංකේතගත වුව ද එය රුදීපවතින්නේ එවන් සංස්ථා තුළ නොවේ. එය පහසුවෙන් හඳුනාගත හැකි පෞද්ගලික ව්‍යාධියකි. මීට වසර ගණනාවකට පෙර Fathering the Unthinkable නම් ග්‍රන්ථය තුළින් Brian Isley තර්ක කළේ න්‍යෂ්ටිකවාදය ක්‍රියාත්මක වන්නේ දැඩි පුරුෂ කේන්ද්‍රිය උත්සහයන් තුළින් බවයි. Isley මනෝ විද්‍යාඥයෙක් නොවූවද Carol Cohn ඇතුළු පිරිසගේ අධ්‍යයනයන් තුළින් Isley ගේ විශලේෂණය තුළ ඇති පෘථුල ආකාරය අනුමත කර තිබේ. ඔවුන් පෙන්වා දෙන්නේ භාෂාව හා මතවාදය පමණක් නොව න්‍යෂ්ටිකවාදය සම්බන්ධ සංස්කෘතිය තුළම දැඩි පුරුෂ කේන්ද්‍රිය සිතුවිලි ක්‍රියාත්මක වන බව හා එම සංස්කෘතියට සහභාගිවන්නන් බෙලහීනතාව හා නෂ්ටකාමය පිළිබඳ ගැඹුරු බියකින් නිරන්තරයෙන් පෙළෙන්නන් බවත් ය. එම හේතුව නිසාම ඔවුන් එම සංස්කෘතිය තුළ උද්වේගයකින් යුතුව ක්‍රියාකාරී වෙති.

> න්‍යෂ්ටිකවාදය සමාජ හා දේශපාලන සංස්ථා තුළ හැදී වැඩී සංකේතගත වුව ද එය රැදීපවතින්නේ එවන් සංස්ථා තුළ නොවේ. එය පහසුවෙන් හඳුනාගත හැකි පෞද්ගලික ව්‍යාධියකි. මීට වසර ගණනාවකට පෙර Fathering the Unthinkable නම් ග්‍රන්ථය තුළින් Brian Isley තර්ක කළේ න්‍යෂ්ටිකවාදය ක්‍රියාත්මක වන්නේ දැඩි පුරුෂ කේන්ද්‍රිය උත්සහයන් තුළින් බවයි

බලය සඳහා වන එවන් පුරුෂ කේන්ද්‍රික උත්සහයන් හෝ ප්‍රේරණයක් ප්‍රාධිකාරවාදයේ (Autho Ritarianism) විවිධ ස්වරූපයක් සමග නිරන්තරයෙන් ගමන් කරයි. මතවාදීමය වශයෙන් ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයන්ට සම්බන්ධ ජනතාව පවා මේ න්‍යෂ්ටිකවාදයට සම්බන්ධ ප්‍රාධිකාරවාදයේ විවිධ ස්වරූපයන්ට සිය සහභාගීත්වය දක්වයි. මෙම සම්බන්ධතාවයට ලැබෙන්නා වූ සහයෝගයක් මනෝ විද්‍යාවෙන් බාහිරව ද දක්නට ලැබේ. න්‍යෂ්ටිකවාදී රාජ්‍යයක් සම්බන්ධයෙන් Robert Jungk ගේ අධ්‍යනයක් පෙන්වා දෙන්නේ ඕනෑම රටක න්‍යෂ්ටික ගොඩ නැගීමක් සමග රහස්‍යභාවය, ආරක්ෂාව, දැඩි අවධානය සහ පොලිස් ක්‍රියාකාරකම් යන කරුණු හතර එයට අවශ්‍යයෙන් ම සම්බන්ධ වන බවයි. මේ අනුව සලකා බලන කල න්‍යෂ්ටිකවාදී සංස්කෘතිය මේ යුගයේදී වඩාත් සත්‍ය ලෙස විශ්වීයත්වයට පත්වී ඇත. එනම් එය කොකා - කෝලා සහ නිල් ජීන්ස් කලිසම් සේම කිසිදු සංස්කෘතික ගලපා ගැනීමකට හෝ සංස්කරණය කරන ලද අනුවාදයක් ඇතිවීමට ඉඩ ලබා නොදෙයි. න්‍යෂ්ටිකවාදය පැරිසියේ සහ පොක්රාන්වල හෝ ලාහෝර් හා ලොස් ඇලමොස්වල හෝ වෙනත් ලොව ඕනෑම ප්‍රදේශයක එක සමාන ස්වරූපයක් දරයි.

න්‍යෂ්ටිකවාදය නිර්මාණය කරනු ලබන්නේ ජාති ඝාතන මානසිකත්වය විසිනි. මේ දෙක අතර සම්බන්ධතාව Eric Markusen සහ Robert J. Lifton විසින් වඩාත් හොඳින් අධ්‍යයනය කර ඇත. The Genocidal Mentality නම් ග්‍රන්ථයෙන් ඔවුන් දෙදෙනා ජන ඝාතකයන්ගේ මනෝභාවය පිළිබඳව තුලනාත්මකව අධ්‍යයනයක් සිදුකරයි. ඔවුන් දෙදෙනා නාසි ජර්මනිය, හිරෝෂිමා හා නාගසාකි සහ වර්තමාන න්‍යෂ්ටික මතවාදීන් ස්වකීය අධ්‍යයනට හසුකර ගන්නා අතර එමගින් න්‍යෂ්ටිකවාදී මනෝභාවයන්ගේ අඛණ්ඩතාව පැහැදිලි කරනු ලබයි.

ජන ඝාතන පුද්ගලයෙකු ගේ මනස තුළ "මානසික හිරිවැටීමක්" දක්නට ලැබේ. එයින් අදහස් වන්නේ මානුෂික හැඟීම් වලට ඇති ධාරිතාවය හෝ ආවේදනය ක්ෂයවීමක් සහ අර්ථ විරහිතතාව පිළිබඳ සාමාන්‍ය දැනීම නොමැති වීමක් ය. මේ ආකාරයට අයෙකුගේ සංවේදීතාවන් හිරි වැටීමකට ලක්වන විට සාමාන්‍ය හැඟීම් හා සදාචාර සිතුවිලි වලට තවදුරටත් ප්‍රවිශ්ට වීමට හැකියාවක් නැතිවේ. එම හිරිවැටීම මගින් පුද්ගලයකු තමාගෙන් ඈත් කරනු ලබන අතර තම ස්වයං ක්‍රියාවලිය සංකෝචනකයට යොමු කරවනු ලබයි. එවන් අයෙකුට අති විශාල මිනිස් සමූහයක මරණයක් හුදු සංඛ්‍යා ලේඛනයක් හෝ යුධමය ජයක් පමණක් වෙයි. එවන් වූ මානසික හිරිවැටීමක් ආවේදනයේ හා දැනීමේ මෙන් ම හැඟීම්වල හා චින්තනයේ වෙන්වීමේ උපරිම අවස්ථාව ලෙස සැලකිය හැකි ය.

ජන ඝාතන මානසිකත්වය විසින් පොදු වගකීම් හා ප්‍රජාතන්ත්‍රිය වගකීම් ඉවුනොකර ඒවායින් ගැලවී සිටීමේ යුගයක් නිර්මාණය කිරීමේ නැම්යාවක් දක්වයි. මෙහිදී අයෙකුගේ නිලවාදී හෝ විද්‍යාත්මක කාර්යභාරය සුපිරි අධිකාරිය විසින් දෙනු ලබන නියෝගවලට ඒවායේ සදාචාරාත්මක ගුණය ගැන නොසිතා ඉතා විශ්වාස වන්තව හා යාන්ත්‍රිකව පිළිපැදීමට යොමු කරනු ලබයි. ඉන්පසු පුද්ගලයා ක්‍රියාකරන්නේ දැති රෝදයක් මෙන් යාන්ත්‍රිකව ය. උදහරණයක් වශයෙන් දෙවන ලෝක යුධ සමයේදී නාසි අපරාධ කරුවන්ට කාන්තාවන්, ළදරුවන් හා වැඩිහිටියන් ඇතුළු අහිංසක ජනතාව මරාදමනු ලැබීමට දෙනු ලැබූ නියෝග සඳහන් කළ හැකි ය.

පොදු වගකීම් වැලැක්වීමේ අනෙක් ක්‍රමය නම් ජනඝාතන මානසිකත්වය පුද්ගලයන්ගෙන් ඉවත්කොට ආයතන ගත කිරීම හා සමස්ථයට ම ආරෝපණය කිරීමයි. එනම් එම ආයතනයන් හෝ සංස්ථා

පුද්ගලයන් අතරට නොපැමිණ ඝාතන යන්ත්‍රයන් ලෙස ක්‍රියාත්මක වීමට සැලැස්වීමයි. මේ සමගම යුධ කාර්මික සංකීර්ණය, ෆැසිස්ට් වාදය, අධිරාජ්‍යවාදය, ස්ටැලින්වාදය, පාලක පංතිය හෝ ඇමරිකානු රාජ්‍යය නායකත්වය ආදී ලොව පවත්නා විවිධ මත වාදයන් රැසක පුද්ගලයන්ගේ දූෂිත ක්‍රියාවලිය ඔවුන්ව නිදහස් කොට ජන ඝාතනය සඳහා අනුමැතිය දෙන තත්ත්වයකට පත්වෙනු ලැබේ. ජනඝාතන මානසිකත්වයක් පැතිරෙන සමාජයක බුද්ධිමත් පුද්ගලයන් පවා අවිඥණක විග්‍රහයන් සත්‍ය ලෙස පිළිගනී. මෙම බුද්ධිමතුන් සමාජ සංස්ථාවන් නිරන්තර දෝෂාරෝපණයට ලක්වන හා ජන ඝාතකයන් දඩුවමින් නිදහස් කර ගැනීමට මනෝ ව්‍යාධික විද්‍යාඥයින්, නීලබලවාදීන් හා දේශපාලනඥයන් උත්සහ කරන සමාජයක කොටස් කරුවන් බවට පත්වේ.

සමහර උච්ජනම අවස්ථාවලදී ඝාතන මානසිකත්වය Necrophilia නම් තත්ත්වයට පත්වේ. මෙහිදී එම රෝගියා ආදරයෙන් මරණය වැළඳ ගන්නා මානසික තත්ත්වයට පත්වේ. ඔහුට හෝ ඇයට මරණය සමග වූ සුරංගනා ලෝකයක් තුළ හෝ ජීවිතයේ ඇති යම් අත්‍යාමී තත්ත්වයන් සමග හෝ සයනය කිරීමට අවශ්‍ය වෙයි. Saadat Hassan Manto ගේ ජනප්‍රිය කථාවක් වන "Cold Meat" හෙවත් "Thanda Gost" හි කර්තෘ නොදනම මෙවන් තත්ත්වයකට උදහරණයක් ඇත. එහිදී මිනීමරුවකු හා ස්ත්‍රී දූෂකයකු වන පුද්ගලයෙක් සමූහ ගැටුමක් සිදුවන විටක දී ස්වකීය ලිංගික ආශාවන් සංතෘප්ත කර ගැනීමට උත්සහ කරනා තුර තමන් පෙළෙන Necrophilia තත්ත්වය සමග ඇතිවන අභ්‍යන්තර ගැටුම නිසා විනාශයට පත්වෙයි. මේ සම්බන්ධ තවත් ප්‍රත්‍යයක අධ්‍යනයක් Erich Formm ගේ The Anatomy of Human Distructiveness නම් ග්‍රන්ථය තුළ ඇත.

න්‍යෂ්ටිකවාදය න්‍යෂ්ටික ආයතන හෝ න්‍යෂ්ටික සමාජ තුළ පමණක් රැඳී නොසිටී. එය සාමාන්‍ය සමාජයටත් විවිධ මනෝ ව්‍යාධීන් හඳුන්වා දෙයි. උදහරණයක් වශයෙන් එය පොදු විඥනය තුළට ඇතුල් වූ විට මිනිසුන් තුළ ජීවිතය පිළිබඳ අවිනිශ්චිතතාවක් නිර්මාණය කරනු ලබයි. කිසියම් දවසක හදිසි යුද්ධයක් හෝ විපතක් මගින් සමස්ත සමාජයම විනාශ වේ යැයි නිරන්තර බියකින් පෙළීමට න්‍යෂ්ටිකවාදය විසින් ජනතාවට බල කරනු ලැබේ. මේ තත්ත්වය විසින් ක්‍රම ක්‍රමයෙන් ජනතාව තුළ ශූන්‍යභාවයක් පිළිබඳ හැඟීමක් නිර්මාණය කරනු ලැබේ. එය සමාජ ජීවිතය තුළ අනවශ්‍ය ප්‍රචණ්ඩතාවක් හෝ අධික කාංසාව සමගින් වූ මානසික රෝග රැසක් ඇති කරනු ලබයි. වෙනත් වචනවලින් කියනවා නම් න්‍යෂ්ටිකවාදය විසින් සාමාන්‍ය ජනතාව තිරිසන් බවට පත්කරනු ලබන අතර එදිනෙද ජීවිතය දූෂණය කරනු ලබයි.

William Beardslee, J. E. March සහ Eleonora Mashini වැනි අයගේ අධ්‍යයනයන්ට අනුව පෙනී යන්නේ උක්ත තත්ත්වයට යොවනවන් හා දරුවන් පවා ගොදුරු වන බවයි. වයස අට දහය අතර දරුවන් පවා ජීවත් වෙන්නේ අනාගතයක් නැතැයි සිතනු ලබන ලොවකයි. ඔවුන් නිරන්තර බියකින් හා කාංසාවකින් පෙළෙන අතර ඒවා සෘජුව ම ප්‍රකාශ කිරීමට අපොහොසත් වෙති. ඒ මන්දයත් න්‍යෂ්ටිකකරණයට බඳුන් වූ සමාජයක න්‍යෂ්ටික මරණය පිළිබඳ බිය දෙස බලනු ලබන්නේ අසාමාන්‍ය මානසික තත්ත්වයන් ලෙසිනි.

බොහෝ නියුරෝසියානු සහ මනෝව්‍යාධික පුද්ගලයක් ප්‍රථමයෙන් පෙනෙන්නේ සාමාන්‍ය ලෙස ලොවට එරෙහිව යන්නන් ලෙසයි. ආරම්භයේ දි න්‍යෂ්ටිකවාදය පෙනෙන්නේ හොඳ තරගයක් ලෙසින් සහ න්‍යෂ්ටික ආයුධවල සහභාගීවන්නන් පෙනී යන්නේ සාමාන්‍ය දේශපාලනඥයන්, ආරක්ෂක විශේෂඥයන් ආදී ලෙසිනි. වෙන එකක් තියා නාසි අපරාධකරුවන් පවා ආදරබර පියවරුන් හෝ සංගීතකාමීන් හෝ අවංක පුරවැසියන් ලෙස පෙනී සිටියහ. නමුත් ඔවුන්ගේ ඉදිරිපස වෙස් මුහුණට පිටු පසින් ආරක්ෂා විරහිතභාවය, තම පුරුෂභාවය පිළිබඳ සැකය, අන්තර්පුද්ගල ලෝකය පිළිබඳ බිය, ආදරය කිරීමේ නොහැකියාව ආදී පෞරුෂ ලක්ෂණ දිව යයි. මෙවන් පෞරුෂයක් ඇති අයෙක් අනුගමනය කරන ප්‍රචණ්ඩත්වය වනා හී ඉහත දැක්වූ ශූන්‍යතාවය පිළිබඳ අභ්‍යන්තර හැඟීම් සමග සටන් කිරීමෙන් උපදින දෙයකි. ඔහුගේ හෘදය සාක්ෂිය මනෝ විද්‍යාත්මකව අනාථ වී ඇති හෙයින් ඔහුට කිසිවක් මනාව සිතීමට නොහැකි වෙයි. ඔහු මිලියන ගණන් ජනතාව ඝාතනය කිරීමට සැලසුම් කරයි. ඒ මන්ද යත් ඔහුගේ සාමාන්‍ය හැඟීම් හා මානුෂික සම්බන්ධතා පිළිබඳ හදවතේ ඇති තත්ත්වයන් විනාශ කර දමනු ලැබ ඇති බැවිනි. මිලියන ගණන් ජනතාව මරා දැමීමට බලය ලබාගනිමින් හා ඒ බලය සමග වූ සිහින ලොවක ජීවත් වෙමින් ඔහු තමා නවමන් ජීවත් වන බවට සහතික කර ගනී. කෙසේ වුවත් ඒ ස්ථාවරත්වය කවදාවත් පැමිනෙන්නේ නැත. එම බලය ලබා ගැනීමේ සටනින් ඔහු සමහරවිට ශාරීරිකව මිය නොගියත් ඔහු දැනටමත් සදාචාරාත්මකව, සාමාජීයව හා මනෝවිද්‍යාත්මකව මිය ගොස් හමාර ය.

මේ අනුව අවසාන වශයෙන් Ashis Nandy සිය විග්‍රහය තුළින් ප්‍රකාශ කර සිටින්නේ න්‍යෂ්ටිකවාදී සංස්කෘතිය පැහැදිලිවම මනෝ ව්‍යාධිවේදික සහලක්ෂණයක් බවත් එය ආයතනගත වීම හරහා සමස්ථ සමාජය ම එහි ගොදුරු බවට පත් වෙමින් සිටින බවත් ය. ❏

**(Himal සඟරාව ඇසුරෙනි)**

**බුද්ධික සුබසිංහ**